ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකః 2477424, 2477423, 2477311
ෆැක්ස්ః 2346257, 2477739
ඊ-මේල්ః dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියః www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014 මැයි 30 |

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 මැයි**

2014 මැයි මස තුළදී මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියෙහි තවදුරටත් සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබුණි.

- අදාළ කටයුතු සැලසුම් කළ කාලරාමු තුළ නිම කිරීම සඳහා ඩීඑෆ්සීසී බැංකුව සහ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ඒකාබද්ධ කිරීම සහ ලංකා බැංකුවේ පරිපාලිත සමාගම් වන මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ් සහ එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් ඒකාබද්ධ කිරීම අපේක්ෂිත පරිදි සිදුකෙරෙමින් පවතී. එකම සමාගම් සමූහය තුළ ක්‍රියාත්මක වන මුදල් සහ කල්බදු සමාගම් ද ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අරඹා ඇත. ඉහළ නංවන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ළඟාකර ගැනීමට හැකි වන පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයකට නව ප්‍රාග්ධනය එක් කිරීමට ආයෝජකයන් උනන්දුව පළකර ඇත.

- ඒ අතරම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද විගණන ආයතන විසින් බැංකු නොවන මූල්‍ය ආයතනවල තොරතුරු පත්‍ර, යථා තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ව්‍යාපාර තක්සේරුකරණ වාර්තා පිළියෙල කිරීම අවසන් කර තිබේ. මෙකී ක්‍රියාවලිය හා සම්බන්ධිත අතිරේක කටයුතු හේතුවෙන් ඇතැම් අවස්ථාවන්හිදී මෙම ක්‍රියාවලිය සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වුණි.

- බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, ඔවුන් වෙත ලබාදෙන ලද තොරතුරු පත්‍ර, යථා තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ව්‍යාපාර තක්සේරුකරණ වාර්තා පදනම් කර ගනිමින් ඒකාබද්ධවීම/අත්පත්කර ගැනීම සඳහා හඳුනාගන්නා ලද පාර්ශව සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.

- මෙම සාකච්ඡා ක්‍රියාවලිය අර්ථාන්විතව සහ සාර්ථකව නිම කිරීම සඳහා අදාළ සාකච්ඡා ක්‍රියාවලියට පහසුකම් සලසන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විගණන ආයතනවලින් ඉල්ලා ඇත. මෙම ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට විගණන ආයතන එකඟ වී ඇත.

- සැලසුම් කළ කාලරාමුව තුළදී ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය නිම කිරීම සඳහා ඒකාබද්ධ කිරීම පිළිබඳ තම නිශ්චිත සැලසුම් 2014 ජුනි 30 දිනට පෙර භාරදෙන ලෙස සියලුම බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට දැනුම් දෙන ලදී.

- ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය යටතේ සුදුසු උපායමාර්ගික ආයෝජකයකු ආකර්ෂණය කරගත හැකි වන ලෙස සමාගමෙහි තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව ද ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී ප්‍රතිව්‍යුහගත කිරීමේ දෙවැනි අදියර ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- 2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත අනුව, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ බදු සහන පිළිබඳ පැහැදිලි අදහසක් ලබාදීම සඳහා අදාළ මාර්ගෝපදේශයන් පිළියෙල කිරීමේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කඩිනමින් අවසන් කරනු ඇත. මෙකී මාර්ගෝපදේශයන් ඉදිරියේදී නිකුත් කෙරෙනු ඇත.

- මෙම මස තුළදී ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳව පැවැත්වූ විවිධ සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූහ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශවකරුවන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අත්පත්කර ගනිමින් තිබෙන ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී.